# 11

# යහපත් මිතුරුකම

اَلْاَخِلَّآءُ يَوْمَ ذٍ بَعْضُهُمْ لِبَعْضٍ عَدُوٌّ اِلَّا الْمُتَّقِيْنَ

**හිතවත් මිතුරන් වූ අයගෙන් (දෙවියන්ට) බිය වී ජීවත් වූ අය හැර (අනෙක් අය) එම දිනයේ දී එකිනෙකාට සතුරන් වනු ඇත. (43 .67)**

මිනිසකුගේ ජීවිතය කෙරෙහි බලපෑම් කරන සාධක ලෙස මිතුරුකම දැක්විය හැකි ය. ඉස්ලාම්, මිතුරුකමට විශාල වැදගත්කමක් ලබා දී ඇත්තේ ය. එය ගැන වැඩිපුර කතා කර ඇත. ඉස්ලාම් දක්වා ඇති ආකාරයට මිත්‍රත්වය ඇතිවන විට එය අල්ලාහ්ගේ ආදරය ද කරුණාව ද ලබා දෙන්නේ ය. එයට වෙනස් වූ මිත්‍රත්වයක් පවතින විට ලොව විවිධ ආකාරයේ ප්‍රශ්න, දුක් වේදනා ඇති කරන්නේ ය. එසේ ම කියාමාවේ දී අල්ලාහ්ගේ කෝපය ද දඬුවම ද ගෙන දෙන්නේ ය.



## ඉස්ලාමයට අනුකූල ව මිතුදම පහත දක්වා ඇති අන්දමට තිබිය යුතුයි

■ දේව විශ්වාසය

දේව විශ්වාසය ඇති අයකු ඔබගේ මිත්‍රයකු කර ගන්න (අබූදාවූද්)

■අල්ලාහ් වෙනුවෙන් මිතුදම

ඊමාන් හි මිහිරියාව විඳීමට භාග්‍යලත් හොඳ මුස්ලිම්වරයකුගේ ලක්ෂණවලින් එකක්, ''ඔහු යමකට සෙනෙහස දක්වනුයේත් සෙනෙහස නොදක්වනුයේත් අල්ලාහ් වෙනුවෙනි'' (මුස්ලිම්)

■ දේව බිය

''හිතවත් මිතුරන් වූ අයගෙන් (දෙවියන්ට) බිය වී ජීවත් වූ අය හැර අනික් අය එම දිනයේ දී කෙනෙකුට අනික් කෙනා සතුරන් වනු ඇත.'' (43:67)



■ පිවිතුරු බව

තම මිතුරන් අතරෙන් ඉතා හොඳ කෙනා අල්ලාහ්ට ඉතා හොඳ කෙනෙක් වන්නේ ය. (තිර්මිදි)

### යහපත පනවා අයහපත වැළැක්වීම

සහබාවරුන්ගේ අයෙක් අන් අයකු හමු වූ විට, ''අපි අපගේ ඊමානය අලුත් කර ගනිමු.'' ''අන් අය නොසැලකිල්ලෙන් සිටින මේ දිනවල අපි දෙවියන්ගෙන් පව් සමාව ඉල්ලමු.'' වැනි වචන පවසා යහපත කෙරෙහි උනන්දු කරවන්නන් ලෙස සිටියහ.

මිත්‍රත්වය හොඳින් පවත්වා ගත හැකි ක්‍රමවේද කිහිපයක් ඉස්ලාම් පෙන්වා දී ඇත.

1. මිතුරන් මුළුමනින් ම වටහා ගැනීම

''මිනිසකු තවත් මිනිසකු සමඟ මිතුරු වූ වා නම් ඔහුගේ නම්, පියාගේ නම්, පරම්පරාව වැනි දේ අසා දැන ගත්තාවේ. එය ඔවුනතර මිත්‍රත්වය දැඩි ව පැවැතීමට හේතුවක් වන්නේ'' ය. (තිර්මිදි)

2. මිත්‍රත්වය පවත්වා ගැනීම

''ඔබගේ අයෙක් තම සහෝදරයා, මිතුරා සමග මිතුරු වූයේ නම් තමන් ඔහු කෙරෙහි මිතුරු වූ බව දැක්වූවාවේ.'' (අහ්මද්)

3. තෑගි භෝග හුවමාරු කර ගැනීම

''තෑගි භෝග හුවමාරු කරගන්න; එය සෙනෙහස වැඩි කරයි'' (බුහාරි)

4. සුබ පැතීම්, මුසාබහාව අතට අතදීම හා මුආනාකා (වැළඳගැනීම) කිරීම.

මුඃමින්වරයකුගේ උතුම් අරමුණ අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගත යුතු ය යන්නයි. හොඳ මිතුරුකම මෙයට සුදුසු අවස්ථාවක් වන්නේ ය.

යහපත් මිතුරුකමේ ප්‍රයෝජන

- කියාමාවේ සෙවණක් නොමැති මහ්ෂරයේ මෙම මිතුරුකම අපට සෙවණක් ලබා දෙන්නේ ය.

  ''මාගේ මහෝන්නතාවය මත සෙනෙහස දක්වන්නන් කොහි ද? වෙනත් සෙවණක් නැති එම දිනයේ දී; මම ඔවුනට සෙවණ ලබා දෙන්නෙමි.'' (අහ්මද්)

- අල්ලාහ් වෙනුවෙන් සෙනෙහස දැක්වූ අය කියාමාවේ දී උසස් තත්ත්වයක් ලබති.

''සමහරු අල්ලාහ්ගේ ගැත්තෝ වෙති. ඔවුහු වක්තෘහු හෝ ෂුහදාවරු හෝ නොවෙති. එහෙත් ඔවුන්ට අල්ලාහ් වෙතින් හිමි වන්නාවූ උතුම් තත්ත්වය දැක ෂුහදාවරු සහ වක්තෘවරු පවා ඊර්ෂ්‍යා වෙති. ඔවුහු අල්ලාහ් වෙනුවෙන් ඔවුනොවුන්ට සෙනෙහස දැක් වූ අය වෙති.'' (අහ්මද්)

- මිතුදම අපගේ පෞරුෂය කෙරෙහි බලපායි.

''යහපත් මිතුරන් සමඟ ඇති අපගේ මිතුරුකම අපට යහපත ගෙනෙන්නාක් මෙන් නරක මිතුරන් සමඟ ඇති මිතුරුකම අයහපත ම ගෙනෙන්නේ ය.

''හොඳ මිතුරා හා නරක මිතුරාට උදාහරණ කස්තූරි වෙළෙන්දා සහ කම්මල්කරුවාට සමාන ය. කස්තූරි වෙළෙන්දා ඔබ සිරුරෙහි කස්තූරි තැවරිය හැකි ය. නැතහොත් එයින් කොටසක් ඔබට ලබා ගත හැකි ය. නැතහොත් එහි සුවඳ ඔබට විඳිය හැකි ය. කම්මල්කරුවාගේ ළිපෙන් ලැබෙන ගිනිදැල් ඔබගේ ඇඳුම් දවා ලිය හැකි ය. නැතහොත් එහි දුම ඔබගේ නාසය දවාලිය හැකි ය. (බුහාරි)

### නරක මිතුදම අපහාසයක් ලබා දෙන්නේ ය

ඉස්ලාමීය ක්‍රමවල වෙනස් වූ මිතුරුකම ලොවේ විවිධ අකාරයේ අපහාස ඇති කරන්නාක් මෙන් ම කියාමාවේ දී පහත් තත්ත්වයක් හා දුකක් ගෙන දෙන්නේ ය.

"අහෝ! මට ඇති වූ විනාශය (මා නොමඟ යැවූ අය මිතුරකු කර ගෙන නොතිබුණා නොවේ ද? සැබවින් ම මිනිසාහට හිතෝපදේශයන් ලැබුණු පසුත් එයින් ඔහු මා නොමඟ යැවුවේ ය." (25:28:29)

මුස්ලිම්වරයකු තම කියාමා ජීවිතය අරමුණු කරගෙන හොඳ මිතුරුකමක් ගොඩ නැඟිය යුතු ය. ගුරුවරුන්, ආලිම්වරුන්, උගතුන් වැනි අය සමඟ මිතුදම ගොඩ නගා ඔවුනොවුන්ගෙන් හොඳ පූර්වාදර්ශ ඉගෙන අනුගමනය කළ යුතු ය. එසේ ම අල් කුර්ආනය පාරායනය කිරීම, ඉගෙනීම, සුන්නත් සලාතයන් හා සෞමය ඉටු කිරීම, දික්ර්, අව්රාදයන්, ආදි සාලිහ් වූ අමල් තම මිතුරු හිත්ගත් ක්‍රියාවන් කර ගත යුතු ය. තව ද හොඳ පොත්පත් සඟරා ආදිය කියවීම, ප්‍රයෝජනවත් විනෝද ක්‍රියාවල යෙදීම, දේහ ශක්තිය වඩවන අභ්‍යාසවල යෙදීම, වැනි ක්‍රියාකාරකම් තම මිතුරු හිත්ගත් ක්‍රියා කර ගත යුතු ය

#### අභ්‍යාසය

වරහන් තුළ දී ඇති ඒවා භාවිත කර පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

1 හොඳ මිත්‍රයාට උදාහරණයකි...............................................................

..........................................

2 අල්ලාහ් වෙනුවෙන් සෙනෙහස දක්වන්නෙ........................................

.........................................................

3 තෑගි බෝග හුවමාරු කර ගැනීම.......................................................

..................................................

4 පිරිසිදු මිතුරුකම හේතුවෙන් සාමාන්‍ය මිනිසුන් අල්ලාහ්ගෙන් ලබන තත්ත්වය බලා..............................................................

5 අපගේ හොඳ අමල් අපට කියාමාවේ දී නිර්දේශ ඉදිරිපත් කරයි

...........................................................................................

(මිතුරුකම වැඩි කරයි. නිර්දේශ ඉදිරිපත් කරයි, කස්තුරි වෙළඳා, නබිවරු ද ඊර්ශ්‍යා කරති, කියාමාවේ සෙවණ ලබති).